CORGI Registered Central Heating Engineer
Reliable, friendly. Any work not too small
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2

Domestic Part P & BS7671 Qualified
Professional Electrical Engineer
All electrical work carried out
Testing-Inspecting and Certification of all work
All jobs undertaken with guarentee
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
Call - රන්ජිත් Ranjith on 07904174241

ලිහිණියා LIHINIYA
ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ
එවලේම පිලියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.
Tel. 0208 450 9052
66 Cricklewood Broadway, London NW2 3EP

## වාසනාවන්තයා

අරාබි ස්වාමියා සිය සේවකයා සමග කාන්තාරයක් මැදින් ගමනක් යමින් සිටියදී දැඩි අව් රශ්මිය නිසා ඔවුන් දෙදෙන ළඟ තිබූ වතුර බෝතල් ඉක්මනින් හිස්විය. තදින් පිපාසය දැනෙන්ට වූ ස්වාමියා වැළපෙන්නට වීය.

**ස්වාමියා :** මට හිතෙනවා ඔටුවෙක් වෙලා ඉපදුනා නම් කොච්චර වාසනාවන්තද කියලා එහෙනම් මට පිපාසය දැනෙන එකක් නෑ

**සේවකයා:** ඔව් සර් එහෙනම් ඇත්තට අපි දෙන්නම කොච්චර වාසනාවන්තද?

**ස්වාමියා :** මං ඔටුවෙක් වුනා නම් උඹ වාසනාවන්ත වෙනවද බූරුවො?

**සේවකයා :** ඇයි සර් එතකොට සර්ට වතුර ඕන වෙන්නෙ නෑ.... මට පයින් යන්න වෙන්නෙ නෑ....

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 /432236
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
TRICO
Shipping & Forwarding Ltd
555 White Hart Lane
London N17 7RP
Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com
නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## අමාරුම ප්‍රශ්නය

**ස**ම්මුඛ පරීක්ෂණයට පැමිණි අයැදුම්කරුගෙන් අධ්‍යක්ෂක වරයා අවසන් ප්‍රශ්නය ඇසීය.

**අධ්‍යක්ෂක:** මේ තමයි අවසාන, ඒවගේම ඉතා වැදගත්ම ප්‍රශ්නය. කැප්ටන් කුක් දේශාටන පහක ගියා. ඒ එකකදි ඔහු මැරුම් කෑවා. ඒක සිද්ධ වුනේ කීවෙනි ගමනේදිද?

**අයැදුම්කරු:** කරුණාකර වෙනත් ප්‍රශ්නයක් අහන්න. මම ඉතිහාසය කියන විෂය කරලාම නැහැ.

## මුදල් බෙදීම

***ස**මාජවාදී අපේක්ෂකයා ඡන්ද රැස්වීමේ ඉතා වේගවත් කතාවක් කළේය.*

**අපේක්ෂකයා :** සහෝදරවරුනි, කාල් මාර්ක්ස් කියලා තියෙනවා රටේ මුදල් හැම දෙනාම අතරේ සමසේ බෙදී යායුතු බව. නමුත් අද මේ රටේ ඉන්න ප්‍රතිගාමී ධනපති පන්තිය මොකක්ද කරන්නේ? සල්ලි ඔක්කොම උන්ගෙ සාක්කුවලට දාගන්න එකයි. අපි බලයට ආවම ඔය යටි මඩි ගහගෙන ඉන්න සල්ලි සේරම එළියට ඇදලා අරගෙන ජනතාව අතර සමසේ බෙදලා දෙනවා.

*රැස්වීමේ සිටි තරුණයෙක් අපේක්ෂකයාගේ කතාවට බාධාකරමින් කෑගසා මෙසේ කීවේය.*

**තරුණයා :** සහෝදරය අනික් අයගෙ මුදල් බෙදන්න කලින් ඔය සහෝදරයගෙ ධනය බෙදල දෙන්නකො

**අපේක්ෂකයා :** මගේ ධනය මේ රටේ ජනගහනය අනුව බෙදුවම එක් කෙනෙකුට ලැබෙන්නෙ හරියටම සත පණහයි....
(සාක්කුවට අත දමා) මෙන්න ආ ඔහේගෙ සත පනහ.....

## මැරෙන්නවත් විදියක් නෑ

**බි**රිඳ සමග ජීවිතය දාවිත්ට තිත්ත විය. ඔහු අවසාන තීරණය ගත්තේය. කඹයක් සොයාගත් දාවිත් එය කාමරයේ වහලේ බාල්කයේ බැඳ අනෙක් කොණේ තොණ්ඩුවක් සාදා මේසය උඩට නැග එදෙස බලා සිටින්නට වීය. ඒ අතරේ බිරිඳ ඔහු සිටින තැනට පැමිණියාය.

**බිරිඳ:** මොන මඟුලක් කරනවද ඕයි මේසෙ උඩ නැගගෙන....?

**දාවිත් :** අපෝ උපෝපන් ජාති මෙහෙමත් ගෑණු.... මට මැරෙන මොහොතෙ වත් හිත සැනසීමෙන් ඒක කරන්න දෙන්නෙ නෑ නේ මේ ගෑනි....

**බිරිඳ :** කරගන්න දෙයක් ඉක්මනට කරගෙන මට ඔය මේසෙ දෙනවා හැට්ටයක් මැද ගන්න තියනවා.

## හඳේ කවුරුවත් නැත!

**හ**ඳට ගොස් ආපසු පොළවට ආ ගගනගාමියෙකුගෙන් ඇමරිකානු වාර්තාකාරයෙක් සම්මුඛ සාකච්ඡාව අවසානයේ මෙසේ ඇසීය.

**වාර්තාකරු:** හඳේ කිසිම ජීවියෙක් නැහැ කියලා නිශ්චිත වශයෙන්ම ඔබ කියනවා.... ඒ කොහොමද?

**ගගනගාමියා :** අපි සැහෙන වෙලාවක් හඳේ ඉඳගෙන ඒ භූමිය හාරලා පස් එකතු කළා. එතකොට එහේ ජීවීන් කවුරු හෝ ඉන්නවා නම් ඇවිල්ලා අඩු ගණනේ එබිලවත් බලන්න එපායැ. එහෙම කිසි කෙනෙක් හම්බවුණේ නැහැ නේ.

## වයස වෙන්න බෑ!

**ලෙඩා:** අනේ ! දොස්තර මහත්තෙයො මගේ වම් කකුල හරියට කකියනවා...අපෝ ඉවසන්න බෑ...

**දොස්තර:** ඔච්චර හිතන්න එපා... වයසට ගියාම ඔහොම තමයි

**ලෙඩා:** ඒ කතාව මං පිළිගන්නෙ නෑ. එහෙම නම් මගේ අනික් කකුලත් ඒ වයසම නේ.... ඒක කකියන්නෙ නෑ...ඔය අගේට තියෙන්නෙ...

Community Legal Service
ANTONS
SOLICITORS
Community Legal Service
For Quality Services
We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

*Contact -* Mrs Rani Bulathwela 07808158360
Rohitha – 07956549447 Nihal – 07930310967
Vajira – 07887840227
ANTONS SOLICITORS
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403
*E-mail :* antons.solicitors@btopenworld.com

## ලෝක දුම්වැටි විරෝධී දිනය
## World No Tobacco Day






**World No Tobacco Day** is observed around the world every year on **May 31**. The member states of the World Health Organization created World No Tobacco Day in 1987. It draws global attention to the widespread prevalence of tobacco use and to its negative health effects. The day aims to reduce the 5.4 million yearly deaths from tobacco related health problems. From 1988 the WHO ( World Health Organization) has presented one or more World No Tobacco Day (WNTD) Awards to organizations or individuals who have made exceptional contributions to reducing tobacco consumption. On May 31st, 2008 the WHO called for a complete ban on tobacco advertising; the organization said studies establish a relationship between exposure to cigarette advertisement and starting smoking.

**සෑ**ම වර්ෂයකම මැයි මස 31 වෙනි දින දුම්වැටි විරෝධී දිනය ලෙස හැඳින්වේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 1987 වසරේදී මෙම දවස නම් කළාය. දුම්වැටි හා දුම්කොළ භාවිතය හේතුකොටගෙන ලෝක ජනතාවට වන සෞඛ්‍ය හානිය පිළිබඳ දැනුම්වත් කිරීම මෙම දිනය පැනවීමේ අරමුණයි. 1988 සිට දුම්බීම මැඩපැවැත්වීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කළ පුද්ගලයින්ට හෝ සංවිධානවලට සම්මාන පිරිනැමීමක් ආරම්භකර ඇත. 2008 මැයි මස 31 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය ලොව පුරා දුම්වැටි හා දුම්කොළ ප්‍රචාරක දැන්වීම් පළකිරීම සම්පූර්ණයෙන්ම තහනම් කෙරෙව්වාය. එම දැන්වීම් නිසා දුම්බීමට තරුණපෙළ යොමුවන බව පෙනී ගොස් ඇත.

ශ්‍රීලංකාවේ ප්‍රමුඛ සංවිධානයක් වන ස්වර්ණ හංස පදනම සෑම වසරකම මෙම දුම්වැටි විරෝධී දිනය ඉතා කැපවීමකින් යුතුව ජනතාව වෙතට ගෙන යන ආයතනයකි. පසුවූ මැයි 31 වන දිනද එය අප රටට විශේෂ තේමාවක් යටතේ ක්‍රියාකාරී වූවාය.

දුම් බොන්නන්ට හා දුම්වැටි අළෙවියට යම් යම් තහංචි පණවා ඇතත් දුම්බීම තවම කිසිම රටක නීතියෙන් තහනම් කර නැත්තේ මන්දැයි ස්වර්ණ හංස පදනම ප්‍රශ්න කරයි. එසේ නොකිරීම නිසා දුම්වැටියට නීත්‍යානුකූල තත්වයක් ලැබී ඇතැයි ද ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයද කරන්නේ බොරුවකයි ද එය පෙන්වා දෙයි.